# 多言語情報コーナー　　　　　　（令和８年　３月号）

## 1. සියලුම පාපැදිකරුවන් වෙත

මාර්ග රථවාහන පනතේ අර්ධ සංශෝධනයක් හේතුවෙන්, බයිසිකල් රථවාහන මාර්ග නීති උල්ලංඝනය කිරීම් සඳහා "රථවාහන නීති උල්ලංඝනය කිරීම් දැනුම්දීමේ ක්‍රමයක් " 2026 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

"රථවාහන නීති උල්ලංඝනය කිරීම් දැනුම්දීමේ ක්‍රමය" යනු වයස අවුරුදු 16 සහ ඊට වැඩි බයිසිකල් පාපැදිකරුවන් මාර්ග නීති උල්ලංඝනය කරන විට දඩ මුදල් ගෙවිය යුතු ක්‍රමයකි.

උදාහරණ ලෙස, පහත දැක්වෙන්නේ ප්‍රධාන වශයෙන් උල්ලංඝනය කරන මාර්ග නීති වේ :

＊ මාර්ග රථවාහන සංඥා රතු එළියක් දැල්වී ඇතිවිට මාර්ගය හරහා ගමන් කිරීම
＊ ස්මාර්ට් ජංගම දුරකතනයක් දෙස බලා පාපැදිය පැදවීම
＊ කුඩයක් සමඟ පාපැදියෙන් ගමන් කිරීම හෝ ඉයර්ෆෝන් සමඟ ඝෝෂාකාරී සංගීතයට සවන් දීම
＊ මාර්ගයේ දකුණු පැත්තෙන් ගමන් කිරීම
＊ නවතිනු යන සංඥා සලකුණ හෝ දුම්රිය හරස් මාර්ගවල නතර කර ගමන් නොකිරීම
＊ රාත්‍රියේ විදුලි පහන් දල්වා නොගෙන පාපැදිය පැදවීම
＊ එකම වේගයෙන් බයිසිකල් දෙකක් හෝ වැඩි ගණනක් එක පැත්තකින් සමාන්තරව යාම

එක් එක් මාර්ග නීති උල්ලංඝනය වීම මත පදනම්ව වසර තුනක් දක්වා සිරදඬුවමකට ලක්වීම හෝ යෙන් ලක්ෂ 5 ක් දක්වා දඩමුදලක් දඬුවමක් ලෙස ලබාදිය හැක. මෙය බරපතල ඝනයේ නීති කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

බයිසිකල් අනතුරුවල මෑත කාලීන වැඩිවීමට ප්‍රතිචාර වශයෙන්, බරපතල තුවාල සහ අනතුරු වැළැක්වීම සඳහා මෙම නීති ස්ථාපිත කර ඇත.එබැවින් පාපැදි ද  මෝටර් රථ සහ යතුරුපැදි වැනි  "රථ වාහන" ලෙස සැලකේ.

කරුණාකර ඔබ වෙන කවරදාටත් වඩා රථවාහන නීතිවලට අවනත වී ආරක්ෂිතව පාපැදි පදවන්න.

## 2. ඉහළ යන උද්දමන සඳහා ළමාරක්ෂක ආධාර දීමනාව සහ එකතුකළ දීමනාව පිළිබඳව

භාණ්ඩ මිල ඉහළ යාම මගින් දැඩි ලෙස පීඩාවට පත් දරුවන් සිටින පවුල්වලට රජය මගින් යෙන් 20,000 ක ජාතික ඉහළ මිල ප්‍රතිචාර ළමාරක්ෂක ආධාර දීමනාවක් සහ තවත් යෙන් 10,000 ක ප්ලස් දීමනාවක් ලෙස නගර කාර්යාලයෙන් විශේෂිත ළමාරක්ෂක ආධාරක් ලෙස ලැබෙනු ඇත.

සුදුසුකම් ලෙස නගරය තුළ ස්ථිර පදිංචිය සහතික කල හා පහත සඳහන් ① සිට ③ දක්වා ඇති ඕනෑම කාණ්ඩයකට අයත් පුද්ගලයින් වේ:

① 2025 සැප්තැම්බර් සඳහා ළමා දීමනාව සඳහා සුදුසුකම් ලැබූ දරුවන්ගේ දෙමාපියන්
② 2025 ඔක්තෝබර් 1 සිට 2026 මාර්තු 31 අතර උපත ලැබූ දරුවන්ගේ දෙමාපියන්
③ 2025 ඔක්තෝබර් 1 වන දින හෝ ඊට පසු දික්කසාද වීම හේතුවෙන් ළමා දීමනාව සඳහා අයදුම් කිරීමට අවශ්‍ය වූ අය.

2026 ජනවාරි පළමුවන දින වන විට නගරයයේ ළමා දීමනාව සඳහා ඉල්ලුම් කළ අය සඳහා, ළමා දීමනාව ගෙවීම මාර්තු 4 වන දින ඔවුන්ගේ ළමා දීමනා ගෙවීම් ගිණුමට තැන්පත් කෙරේ. අනෙකුත් සියලුම පුද්ගලයින් ළමාරක්ෂක සාමාන්‍ය කටයුතු අංශයට මේ සඳහා අයදුම් කළ යුතුය.

මෙම දීමනාව වයස අවුරුදු 0 සිට උසස් පෙළ තුන්වන වසර දක්වා එක් දරුවෙකු සඳහා යෙන් 30,000 ක් වන අතර මෙය එක් වරක් පමණක් ලබාදීමේ ආධාර මුදලක් වනු ඇත.

# 多言語情報コーナー　　　　　　　（令和８年　３月号）

**3. ඝන ද්‍රව්‍ය හෝ තෙල් අපජලය බැහැරකරන නල මාර්ග මගින් බැහැර නොකරන්න.**

නිවසේ මුළුතැන්ගෙයින්  සහ ව්‍යාපාර ස්ථානවල ඇති මුළුතැන්ගෙයි මගින් අපජල නල වලට ගලා යන අපද්‍රව්‍ය සහ තෙල්, අපජල නල අවහිර කළ හැකි අතර, එමඟින් අපජල නල මාර්ග හා සම්බන්ද මැන්හෝල් වලින් අපජලය පිටාර ගැලීම ද සිදුවිය හැක.

මෙවැනි සිදුවීම වැළැක්වීම සඳහා, කසළ සහ තෙල් අපජල පද්ධතියට ගලා නොයන බවට සහතික වීමට පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

・වැසිකිළි සඳහා පමණක් භාවිතා කරන කඩදාසි හැර වෙනත් කිසිදු ආකාරයේ කඩදාසි ජලය සමග බැහැර නොකිරීම.

・භාවිතා කරන ලද ඉවුම් පිහුම් උපකරණ සහ භාජන සේදීමට පෙර ඒවායේ ඇති තෙල් හොඳින් පිසදැමීමෙන් පසු සෝදන්න.

・ සුප් සහ අනෙකුත් ඉතිරි ඝන කොටස් ඒ ආකාරයෙන්ම බැහැර කිරීම වෙනුවට බැහැර කිරීමට පෙර භාවිතයට නොගත් රෙද්දකින් පෙරා ඝන කොටස් වෙන්කර ගැනීම හෝ ඒවා කඩදාසි හෝ ඒ හා සමාන දෙයක් මගින් අවශෝෂණය කර ගැනීම.

・බැදුම් සඳහා භාවිතා කල තෙල් වාණිජමය වශයෙන් ලබා ගත හැකි කැටි ගැසීමේ කාරකයක් සමඟ ඝනීභවනය කර පසුව එය දහනය කළ හැකි කසළ ලෙස ඉවත දමන්න. තවද , ඔබට තෙල් වල ඇති විශාල අංශු ඉවත් කර ප්‍රමාණවත් ලෙස සිසිල් කර හිස් ප්ලාස්ටික් බෝතල් වලට දමා ඉවත් කල හැකිය.

ඉහත සඳහන් ආකාරයට ප්ලාස්ටික් බෝතල් වලට දමා තදින් පියන වසා බැහැර කල හැකි අතර එසේ බැහැර කිරීමට හැකියාව ඇත්තේ ආහාර සකස්කිරීමේදී ඉවතදමන තෙල් පමනක් වේ. ප්‍රධාන එකතු කිරීමේ ස්ථාන ලෙස ප්‍රධාන නගර ශාලා ගොඩනැගිල්ලේ වාහන නැවැත්වීමේ ස්ථානයේ ආරක්ෂක නිලධාරියාගේ කාර්යාලයට යාබදව, සෑම ප්‍රාදේශීය ශාඛා කාර්යාලයකම ප්‍රජා සංවර්ධන ප්‍රවර්ධන අංශය, මිච්නෝ එකී වැනි  ස්ථානවල තබා ඇති බහාලුම් ආකාරයේ එකතු කිරීමේ ස්ථාන වෙත බැහැර කල හැකිය. තවද නගරයේ පහත සඳහන් සුපිරි වෙළඳසැල් තුනෙහි එකතු කිරීමේ ස්ථාන ද ඇත. තොරිසෙන් කුරා නො මචි ශාඛාව, තොරිසෙන් ඔහිරා ශාඛාව, තොරිසෙන් ෆුජියෝකා ශාඛාව සහ ඔතනි නිෂිකාතා ශාඛාව වේ.

යම් හෙයකින් ඔබගේ අපද්‍රව්‍ය අපවහන නල මාර්ග අවහිර වී අපද්‍රව්‍ය ගලා නොයන්නේ නම් , කරුණාකර තොචිගි නගරයේ නම් කරන ලද ජලාපවහන පද්ධති කොන්ත්‍රාත්කරුවෙකුගෙන් විමසන්න.